# වාසනා මල්ල



එස්. එම්.අසලියා මන්දස්මී සමරතුංග

**කෘතියේ නම**

වාසනා මල්ල (ළමා කතන්දර)

**කතෘ**

එස්.එම්.අසලියා මන්දස්මි සමරතුංග

4 ශ්‍රේණිය

මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර

**කතෘ ප්‍රකාශනයකි**

**කතෘගේ වෙනත් කෘති**

දැන් අපි යාළුයි (ළමා කතන්දර 2020 දෙසැම්බර් )

**කෘතිය පල කල දිනය**

2023/12/24

**ISBN 978-624-206-995-1**

# පිදුම

කතාවක් ලියන්න කියමින් නිතරම මා උනන්දුකල

**මගේ ආදර අම්මාට**

මා කුරුටු ගෑ දේ කියවා ආදරයෙන් දිරිමත් කල

**මගේ අප්පච්චිට**

**මගේ ආදර අයියාට**

මෙවන් අවස්ථාවක් උදාකරදුන්

**මගේ විදුහල් මෑණියන්ට**

මගේ මේ දෙවැනි වෑයම

උපහාරයක්ම වේවා!

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබු සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර,

විදුහල්පතිනිය,


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

2023 '11 ' 01

නගරයක එක්තරා ප්‍රසිද්ධ සුන්දර පාසලක් තිබුණා. ළමුන්ගේ අධ්‍යාපනයට අදාල සියලුම පහසුකම් මෙම පාසලේ තිබුණා. එහි ඉගෙනුම ලබන ළමුන් ඉතා දක්ෂ ප්‍රීතිමත් ළමයි වුණා.

නමුත්, ප්‍රාථමික අංශයේ එක පංතියක මොලී කියලා ගැහැනු ළමයෙක් හිටියා. එයා නම් මේ පාසලේ දුකින්ම හිටිය ළමයා වුණා.

මොකද දන්නවද? එයාට පංතියේ කිසිම යාළුවෙක් හිටියේ නැහැ. එයා පංතියේ වැඩටත් දුර්වලයි, පාසලේ කිසිම බාහිර දෙයකට ඉදිරිපත් වුණෙත් නැහැ. එයා පන්තියේ කොන්වෙලා හිටිය ළමයෙක්. එයාගේ මේ කුලෑටිකම නිසාම කවුරුවත්ම එයා ගැන සැලකිලිමත් වුණේ නැහැ.



දවසක් මෙයා බොහොම දුකින් ක්‍රීඩාපිටියේ සෙල්ලම් කරමින් සිටින ළමුන් දිහා බලාගෙන හිටියා. මොලී දුකින් ඉන්න දිහා තවත් කෙනෙක් බලාගෙන හිටියා. ඒ තමයි එමී, එයා මොලීගේ පංතියේ ඉන්න ඉතා දක්ෂ හිත හොඳ ප්‍රීතියෙන් හිටපු ගැහැනු ළමයෙක්.

එමී මොලී ලගට ඇවිත් “ඔයා මොකද දුකින් ඉන්නේ” කියලා ඇහුවා. “මට යාලුවෝ කවුරුත් නැහැ”, කියලා මොලී කිව්වා. එමීට මොලී ගැන ගොඩක් දුක හිතුණා. “ඇයි ඔයාට යාලුවෝ නැහැ කියන්නේ ” එමී ඇහුවා. “මට හරියට ඉගෙන ගන්නත් බැහැ, ක්‍රීඩා කරන්නත් බැහැ, ඒ නිසා කවුරුත් මට කැමති නැහැ, මම වගේ ළමයෙකුගෙන් කාටවත් වැඩක් නැහැ” මොලී කිව්වා.

“ඇයි එහෙම කියන්නේ ඔයාට ඉගෙන ගන්නත් පුලුවන්, ක්‍රීඩා කරන්නත් පුලුවන්, හැමෝවම කැමති කර ගන්නත් පුලුවන්, ඔයා ඒකට කැමතිද?” එමී ඇහුවා.



“ඔව් මම කැමතියි ඒ කොහොමද?” මොලී පුදුමයෙන් ඇහුවා.

“ඒක රහසක්ල ඒක මැජික් එකක් ඒකට කරන්න තියෙන්නේ පොඩි දෙයක්” එමී කිව්වා.

“අනේ ඔයා වගේ දක්ෂ වෙලා සතුටින් ඉන්න රහස මටත් කියලා දෙනවාද මොලී ඇහුවා.”

“හොදයි මම කියලා දෙන්නම්” සතුටින් සිටීමේ රහස තමයි වාසනා මල්ල සිහින සැබෑ කරන වාසනා මල්ල එමී කිව්වා.

“වාසනා මල්ල මටත් පුලුවන්ද ඒකක් ගන්න” මොලී ඇහුවා.

“ඒක ගන්න බැහැ අපි හදාගන්න ඕනේ, මේක මට කියලා දුන්නේ අපේ අම්මා” එමී කිව්වා.


මල්ල

“හොඳයි මුලින්ම ඔයා ලස්සන මල්ලක් හදා ගන්න ඒක ලස්සනට සරසා ගන්න ඊට පස්සේ ඔයාට මොනවා හරි ලබා ගන්න ආස දෙයක් තියෙනව නම් ඒ ගැන චිත්‍රයක් ඇදලා ඒ මල්ල ඇතුලට දාල මල්ලේ කට ගැට ගහන්න. ඊට පස්සේ ඔයා ඒක විශ්වාසයෙන් උනන්දුවෙන් කරලා බලන්න. ඔයාට ඒ ජයග්‍රහණය ලබා ගන්න පුලුවන්”. එමී කිව්වා.

මොලීගේ හිතට එය තදින්ම දැනුණා. එයා එදාම ගෙදර ගිහින් ලස්සන මල්ලක් හැදුවා.

ඊට පස්සෙ එයාගේ පළවෙනිම බලාපොරොත්තුව වුණ ලග ලගම එන ක්‍රීඩා උත්සවයේ ජයග්‍රහණයක් ලබා ගැනීම ගැන චිත්‍රයක් ඇදලා ඒ මල්ල ඇතුලට දාල කට ගැට ගැහුවා. දැන් මොලීට හරි සතුටුයි. එයා එදා ඉදලා තරගය සදහා සූදානම් වුණා. මොලී විශ්වාස කළා වාසනා මල්ල එයාට උදවු කරයි කියලා. ඇත්තටම මොලීට ඒ තරගයෙන් ජයග්‍රහණයක් ලැබුණා.


1st
N
S
m
W
1st

ඒක එයා ලබපු පළවෙනි ජයග්‍රහණය වුණා. මොලීට එයා ගැන විශ්වාසයක් ඇති වුණා. තවත් දිරිමත් වුණා.

ඉතින් දවසින් දවස මොලීගේ වාසනා මල්ල පිරුණා. එයා විවිධ දක්ෂතා පෙන්නුවා. පංතියේ ඉදිරියටම ගියා. ළමයින්ටත්, ගුරුවරුන්ටත් හරි පුදුමයි. මොලීට හැමෝම ආදරේ කළා. පංතියේ හැමෝම එයාගේ යාලුවෝ වුණා.



මොලී එයාගේ හැම සතුටකටම හේතුව වුණු එමීට හැමදාමත් ස්තූතිවන්ත වුණා.

ටිකෙන් ටික මොලීට තේරුණා වාසනා මල්ල කියන්නේ එයාගේ අධිෂ්ඨානය සහ විශ්වාසය කියලා.

**පුංචි අපිත් විශ්වාසයෙන් අධිෂ්ඨානයෙන් ජීවිතය ජයගන්න ඕනේ.**

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ, ආර්ථික, පරිවර්තනයන් හේතුකොට ගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක